සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்பிரகமுவ பர்டசைத் திணைக்களம்
Department of Examination - Sabaragamuwa

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2021
General Certificate Of Education (Adv. Level) Examination

**Chemistry I**

| 02 | S | I |
|---|---|---|

පැය දෙකයි
Two hours

සියලුම ප්‍රශ්ණ වලට පිලිතුරු සපයන්න

1) පහත දැක්වෙන I හා II ප්‍රකාශ සලකන්න
   I. විද්‍යුතයේ මූලික අංශුව සඳහා ඉලෙක්ට්‍රෝනය යන නම ඉදිරිපත් කිරීම
   II. ඉලෙක්ට්‍රෝනයේ ආරෝපණය 1.602 x $10^{-19}$C ලෙස අනාවරණය කර ගැනීම

   මෙම I හා II ප්‍රකාශන වල සඳහන් කරුණු ඉදිරිපත් කල විද්‍යාඥයින් පිලිවෙලින්
   I. ජෝන් ඩෝල්ටන් සහ ජේ.ජේ. තොම්සන්
   II. ජොන්ස්ටන් ජී.ස්ටෝනි සහ රොබට් මිලිකන්
   III. ජොන්ටන් ජී.ස්ටෝනි සහ ශ්‍රීමත් විලියම් කෲක්ස්
   IV. රොබට් මිලිකන් සහ ජොන්ස්ටන් ජී. ස්ටෝනි
   V. ජේ.ජේ තොම්සන් සහ ජේම්ස් චැඩ්වික්

2) කොබෝල්ට් පරමාණුවේ (Z- 27) n=3 ප්‍රධාන ක්වොන්ටම් අංකය ආශ්‍රිත මුළු ඉලෙක්ට්‍රෝන සංඛ්‍යාව වන්නේ
   I. 10
   II. 07
   III. 15
   IV. 06
   V. 02

3) මින් කවරක් අණු අතර හයිඩ්‍රජන් බන්ධන නොසෑදුවද ජල අණු සමග හයිඩ්‍රජන් බන්ධන සාදයිද?
   I. එතේන්
   II. ප්‍රොපනෝල්
   III. එතනොයික් අම්ලය
   IV. ප්‍රොපනෝන්
   V. ක්ලෝරො මෙතේන්

4) ඩයිනයිට්‍රජන් ටෙට්‍රොක්සයිඩ් ($N_2O_4$) අණුව සහා ඇඳිය හැකි ස්ථායි සම්ප්‍රයුක්ත ව්‍යුහ ගණන වනුයේ

I. 2
II. 1
III. 3
IV. 5
V. 4

5) දී ඇති සංයෝගයේ IUPAC නාමය වනුයේ

```
          OH      O
          |       ||
CH3 -     C   -   C - CHICH3
          |
          H
```

I. 2-iodo-4-hydroxypentan-3-one
II. 2-hydroxy-4-iodopentan-3-one
III. 3-oxo-4-iodopentan-2-ol
IV. 4-iodo-3-oxopentan-2-ol
V. 2-hydroxy-4-iodopentan-3-al

6) අයනික අරය වැඩිවන අන්දමට සකසා ඇත්තේ මින් කවරක්ද?

I. $Mg^{2+} < S^{2-} < Cl^{-} < K^{+} < Ca^{2+}$
II. $Mg^{2+} < Ca^{2+} < K^{+} < Cl^{-} < S^{2-}$
III. $S^{2-} < Ca^{2+} < Cl^{-} < K^{+} < Mg^{2+}$
IV. $Ca^{2+} < Mg^{2+} < Cl^{-} < S^{2-} < K^{+}$
V. $K^{+} < Mg^{2+} < Ca^{2+} < Cl^{-} < S^{2-}$

7) $27^{0}C$ දී Ne වායුවේ වර්ග මධ්‍යයන ප්‍රවේගයට සමාන වර්ග මධ්‍යයන ප්‍රවේගයක් $N_2$ වායුවට ලැබෙන්නේ කවර උෂ්ණත්වයකදීද?
(Ne=20, N= 14)

I. $420^{0}C$
II. 147K
III. 210K
IV. 420K
V. 500K

8) එක්තරා ක්‍රියාවලියකදී $MnO_4^-$ අයන $Mn^{2+}$ අයන බවට ඔක්සිහරණය වේ. එහිදී ඉලෙක්ට්‍රෝන මවුලයක් ලබා ගන්නා $MnO_4^-$ ස්කන්ධය වනුයේ (Mn=55, O= 16)

I. 25.0g
II. 11.9g
III. 23.0g
IV. 24.8g
V. 23.8g

9)

$$CH_3CHO + CH_3CHO \xrightarrow[\text{2. } H^+/\ \Delta]{\text{1. තනුක NaOH}} A \xrightarrow{NaBH_4/\text{Methanol}} B$$

මෙහි B විය හැක්කේ ,

I. $CH_3CH_2CH_2CH_2OH$
II. $CH_3CH_2CH_2CHO$
III. $CH_2{=}CHCH_2CH_3$
IV. $CH_3CH(OH)CH_2CH_3$
V. $CH_3CH{=}CHCH_2OH$

10) $BaCrO_4$ ; 1.0g ක් මුළුමනින්ම දිය කිරීමට අවශ්‍ය අවම ජල පරිමාව කොපමණද?
(Ba =137, Cr=52,)=16)
$K_{sp}$ BaCrO4(s) = $1.2 \times 10^{-10}$ $mol^2dm^{-6}$

I. 360.8 $dm^3$
II. 300.3 $dm^3$
III. 360 $dm^3$
IV. 400.5 $dm^3$
V. 350.8 $dm^3$

11) පහත දක්වා ඇති කුමන ප්‍රතික්‍රියා යාන්ත්‍රණය නිවැරදි නොවේද?

I.


II.


III.


IV. 

V. 

12) $H_2S$, $H_2Se$, $H_2O$ සහ $NH_3$ යන ප්‍රභේද වල බන්ධන කෝණ වැඩිවන අනුපිළිවෙළ වන්නේ,

I. $H_2O < H_2S < H_2Se < NH_3$
II. $H_2S < H_2Se < H_2O < NH_3$
III. $NH_3 < H_2O < H_2S < H_2Se$
IV. $H_2Se < H_2S < H_2O < NH_3$
V. $H_2Se < H_2O < H_2S < NH_3$

13) පහත සඳහන් දත්ත සපයා ඇත.

$\frac{1}{2}N_2(g) + \frac{3}{2}H_2(g) \rightarrow NH_3$ ;$\Delta H^{\phi}$ = -46 $kJmol^{-1}$

$H_2(g) \longrightarrow 2H(g)$;$\Delta H^{\phi}$ = = + 436 $kJmol^{-1}$

NH3 (g) හි N-H බන්ධනයේ සම්මත බන්ධන විඝටන එන්තැල්පිය = + 391 $kJmol^{-1}$

$N \equiv N$ බන්ධනයේ සම්මත බන්ධන විඝටන එන්තැල්පි අගය $kJmol^{-1}$ වලින්

I. - 473
II. + 473
III. + 946
IV. – 946
V. +236.5

14) $CaC_2O_4$ ඝනය තාප වියෝජනය පහත ආකාරයට සිදුවේ.

$500^0$C දී පමණ $CaC_2O_4(s) \longrightarrow CaCO_3(s) + CO(g)$

$900^0$C දී පමණ $CaCO_3(s) \longrightarrow CaO(s) + CO_2(g)$

$MgC_2O_4$ පහත ආකාරය වියෝජනය වේ

$MgC_2O_4(s) \longrightarrow MgO(s) + CO(g) + CO_2(g)$

$500^0$C දී පමණ $CaC_2O_4$ හා $MgC_2O_4$ අඩංගු මිශ්‍රණයක් සලකන්න. $500^0$C දී මිශ්‍රණයේ ස්න්ධය 4g ක් විය.$900^0$C දී මිශ්‍රණයේ ස්න්ධය 2.68g ක් විය.ආරම්භක මිශ්‍රණයේ තිබූ $MgC_2O_4$ ස්කන්ධය වනුයේ (Mg- 24, Ca= 40, O= 16, C= 12)

I. 0.28g
II. 2.9g
III. 0.028g
IV. 2.8g
V. 0.29g

15) සංවෘත දෘඪ බඳුනක් තුල P(s) 3.0 mol T K උෂ්ණත්වයකදී තබා ඇත. එහිදී යන $2P_{(s)} \rightleftharpoons 2Q_{(s)} + R_{(g)} + S_{(g)}$ සමතුලිතය ඇතිවේ. සමතුලිත අවස්ථාවේ පද්ධතියේ සමස්ථ පීඩනය $8 \times 10^5$ Pa වේ . මෙම උෂ්ණත්වයේදී Kp වන්නේ

I. $8 \times 10^{10}\ Pa^2$
II. $16 \times 10^{10}\ Pa^2$
III. $4 \times 10^{10}\ Pa^2$
IV. $64 \times 10^{10}\ Pa^2$
V. $1.6 \times 10^{10}\ Pa^2$

16) 


A විය හැක්කේ

I. 


II. 


III. 


IV. 


V. 

17) පහත සඳහන් ප්‍රකාශ අතරින් අසත්‍ය ප්‍රකාශය කුමක්ද?

I. අයනික ඝනයක් ජලයේ දියවීමේදී $\Delta H_L^\theta$ සහ $\Delta H_{hyd}^\theta$ යන සාධක දෙකම බලපායි.

II. යම් ප්‍රභේදයක සම්මත උත්පාදන එන්තැල්පි අගය සෘණ නම් එය ඒවායේ සංඝටක මූලද්‍රව්‍ය වලට සාපේක්ෂව ස්ථායිය.

III. යම් ප්‍රතික්‍රියාවක $\Delta H^\theta$ අගය සෘණ නම්, එනම් ප්‍රතික්‍රියාව තාපදායක නම් එය සැමවිටම ස්වයංසිද්ධ වේ.

IV. යම් ප්‍රතික්‍රියාවක $\Delta H > 0$ හා $\Delta S > 0$ වන විට එම ප්‍රතික්‍රියාව ඉහළ උෂ්ණත්ව වලදී ස්වයංසිද්ධ වේ.

V. යම් ප්‍රතික්‍රියාවක $\Delta H > 0$ හා $\Delta S < 0$ නම් එම ප්‍රතික්‍රියාව කිසිසේත්ම ස්වයංසිද්ධ නොවේ.

18) $5.9 \times 10^{6}\ ms^{-1}$ ක ප්‍රවේගයෙන් ගමන් කරන ස්කන්ධය $9.10 \times 10^{-31}$ kg වන ඉලෙක්ට්‍රෝනයක ඩී බ්‍රෝග්ලී තරංග ආයාමය ($h = 6.626 \times 10^{-34}$ Js)

I. $1.23 \times 10^{-9}$ m

II. $0.123 \times 10^{-10}$m

III. $1.23 \times 10^{-10}$m

IV. $1.23 \times 10^{-14}$ m

V. $12.3 \times 10^{-10}$ m

19) C ඉලෙක්ට්‍රෝඩ භාවිතා කර $CuSO_{4\,(aq)}$ ද්‍රාවණයක් 10 A ධාරාවක් මගින් මිනිත්තු 30ක කාලයක් තිස්සේ විද්‍යුත් විච්ඡේදනය කළ විට කැතෝඩයේදී තැම්පත් වන Cu ස්කන්ධය කොපමණද? (Cu= 63.5, 1F = 96500cmol$^{-1}$)

I. 0.0932g

II. 59.22g

III. 6.922g

IV. 5.922g

V. 0.5922g

20) කාබොනිල් සංයෝග පිලිබඳව සත්‍ය ප්‍රකාශය වන්නේ,

I. ඇල්ඩිහයිඩ ආම්ලික $KMnO_4$ මගින් අනුරූප කාබොක්සලික් අම්ලය දක්වා ඔක්සිහරණය වේ.

II. කාබොනිල් සංයෝග සියල්ලම ස්වයං සංඝනනයට ලක්වේ.

III. කාබොනිල් සංයෝග හා බ්‍රේඩි ප්‍රතිකාරකය අතර ප්‍රතික්‍රියාවේදී පළමුව නියුක්ලියෝෆිලික ආකලන ප්‍රතික්‍රියාවක් සිදුවී ලැබෙන ඵලයෙන් ජල අණුවක් ඉවත්වීම සිදුවේ.

IV. එතනැල් ග්‍රීනාඩ් ප්‍රතිකාරකය සමග ප්‍රතික්‍රියා කරවා ලැබෙන ඵලය ජල විච්ඡේදනය කළ විට ප්‍රාථමික ඇල්කොහොලයක් ලැබේ.

V. කාබොනිල් සංයෝග HCN සමග නියුක්ලියෝෆිලික ආදේශ ප්‍රතික්‍රියාවක් සිදුකරයි

21) පහත ප්‍රකාශන අතරින් S ගොනුවේ මූලද්‍රව්‍ය සහ ඒවායේ සංයෝග පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ

I. සියලුම ක්ෂාරීය පාංශු ලෝහ ජලය සමග ප්‍රතික්‍රියා කර $H_{2(g)}$ සහ අනුරූප හයිඩ්‍රොක්සයිඩය ලබාදේ

II. ක්ෂාර ලෝහ අතරින් ඉහළම දෙවන අයනීකරණ ශක්තිය ඇත්තේ Li ටය

III. මැග්නීසියම් සාන්ද්‍ර $H_2SO_4$ අම්ලය සමග ප්‍රතික්‍රියා කර $MgSO_4$ සහ $H_2$ වායුව සාදයි.

IV. ක්ෂාරීය පාංශු ලෝහ හයිඩ්‍රොක්සයිඩ සහ සල්ෆේට වල ජල ද්‍රාව්‍යතාව කාණ්ඩයේ පහළට යත්ම අඩුවේ.

V. සියලුම ක්ෂාර ලෝහ වාතයේ දහනය කල විට අනුරූප ඔක්සයිඩය සහ නයිට්‍රයිඩ සාදයි

22) පහත දක්වා ඇති ප්‍රකාශන අතරින් පද්ධතියක එන්ට්‍රොපිය සහ එන්ට්‍රොපි විපර්යාස පිළිබඳ අසත්‍ය ප්‍රකාශ වන්නේ,

I. ප්‍රතික්‍රියාවක ස්වයංසිද්ධතාව ප්‍රකාශ කිරීමට එන්ට්‍රොපි විපර්යාසය පමණක් ප්‍රමාණවත් වේ.

II. ඝන ද්‍රව්‍යයක් ද්‍රව වීමේදී එන්ට්‍රොපි අගය ඉහළ යයි.

III. දියමන්ති සහ ග්‍රැෆයිට් යන දෙකම කාබන් හි බහුරූපී ආකාර වුවද දියමන්ති වල සම්මත එන්ට්‍රොපි අගය ග්‍රැෆයිට් වල එන්ට්‍රොපි අගයට වඩා අඩුය

IV. උෂ්ණත්වය ඉහළ යන විට අණුවල උත්තාරණ සහ භ්‍රමණ චලිත වේගවත් වන නිසා උෂ්ණත්වය ඉහළ යන විට එන්ට්‍රොපි අගය ඉහල යයි.

V. Methane සහ Ethane සලකන විට ethane හි ව්‍යුහය වඩා සංකීර්ණ බැවින් ethane හි එන්ට්‍රොපිය methane හි එන්ට්‍රොපියට වඩා වැඩිය

23) HA නම් දුබල ඒක භාෂ්මික අම්ලය , ඒක ආම්ලික ප්‍රබල භෂ්මයක් මගින් අනුමාපනය කරනු ලැබේ. දුබල අම්ලයේ විඝටන නියතය Ka ද ජලයේ අයනීකණ නියතය Kw ද සෑදෙන ලවණයේ සාන්ද්‍රණය C ද නම් 298K දී ඉහත අනුමාපනයේ සමකතා ලක්ෂ්‍යයේ pH අගය ලබා දෙන්නේ,

I. $pH = \frac{1}{2}pKa + \frac{1}{2}pKw + \frac{1}{2}\log C$

II. $pH = \frac{1}{2}pKa - \frac{1}{2}pKw + \frac{1}{2}\log C$

III. $pH = \frac{1}{2}pKw - \frac{1}{2}pKa + \frac{1}{2}\log C$

IV. $pH = \frac{1}{2}pKa + \frac{1}{2}pKw - \frac{1}{2}\log C$

V. $pH = \frac{1}{2}pKa - \frac{1}{2}pKw - \frac{1}{2}\log C$

24) සංශුද්ධ යකඩ කම්බියකින් 11.2 g ක් තනුක සල්ෆියුරික් අම්ලයේ දියකර එයට $KMnO_4$ 2g ක් එකතු කරයි.ප්‍රතික්‍රියාව සම්පූර්ණ වූ පසු වැඩිපුර ඉතිරිව පවතින්නේ කවර ප්‍රභේදයක කවර ස්කන්ධයක්ද?

(K = 39, Mn = 55, O=16, Fe = 56)

I. $KMnO_4$ 7.67g
II. Fe 0.767g
III. Fe 7.67g
IV. $KMnO_4$ 1.64 g
V. Fe 0.0767g

25) එක්තරා ආම්ලික $M^{3+}{}_{(aq)}$ අයන නියැදියක $M^{3+}{}_{(aq)}$ සාන්ද්‍රණය $3.0 \times 10^{-6}$ $moldm^{-3}$ වේ. $M(OH)_3$ ලෙස අවක්ෂේප වීමට ද්‍රාවණයේ pH අගය කොපමණ විය යුතුද?

Ksp $M(OH)_3$ = $2.4 \times 10^{-20}$ $mol^4dm^{-12}$

I. 4.7
II. 10.3
III. 5.7
IV. 8.3
V. 9.3

26) සම්මත Zn ඉලෙක්ට්‍රෝඩය හා Ag/ AgCl ඉලේක්ට්‍රෝඩය යොදාගෙන සකස් කල පහත කෝෂය සලකන්න




කෝෂයේ IUPAC අංකනය වන්නේ

I. $Zn_{(s)}$ / $Zn^{2+}{}_{(aq)}$ ¦ $Cl^{-}{}_{(aq)}$ / $AlCl_{(s)}$ / $Ag_{(s)}$

II. $Ag_{(s)}$ / $AlCl_{(s)}$ / $Cl^{-}{}_{(aq)}$ // $Zn_{(s)}$ /$Zn^{2+}{}_{(aq)}$

III. $Zn_{(s)}$ / $Zn^{2+}{}_{(aq)}$ (1 ml $dm^{-3}$) $Cl^{-}{}_{(aq)}$ (1 ml $dm^{-3}$) / $AlCl_{(s)}$ / $Ag_{(s)}$

IV. $Zn^{2+}{}_{(aq)}$ (1 ml $dm^{-3}$) / $Zn_{(s)}$ $Ag_{(s)}$ / $AlCl_{(s)}$ / $Cl^{-}{}_{(aq)}$ (1 ml $dm^{-3}$)

V. $Zn_{(s)}$ / $Zn^{2+}{}_{(aq)}$ (1 ml $dm^{-3}$) // $Cl^{-}{}_{(aq)}$ (1 ml $dm^{-3}$) / $AlCl_{(s)}$ / $Ag_{(s)}$

27) X නැමැති කාබනික සංයෝගය ජලයේදීට වඩා $CCl_4$ තුල දියවෙයි. $CCl_4$ සහ ජලය අතර ව්‍යාප්ති සංගුණකය 4කි. මෙම කාබනික සංයෝගයක ජලීය ද්‍රාවණයකින් 100 $cm^3$ ක්තුල කාබනික සංයෝගය 3.00g අඩංගු වේ. මේ සාම්පලය $CCl_4$ 25$cm^3$ කොටස් දෙකක් මගින් අනුයාතව නිස්සාරණය කරන ලදී. අවසානයට ලැබෙන ජලීය ද්‍රාවණයේ 100$cm^3$ හි ඉතිරිව පවතින කාබනික සංයෝගයේ ස්කන්ධය

I. 1.50g
II. 1.25g
III. 1.00g
IV. 0.75g
V. 0.33g

28) පහත ප්‍රතික්‍රියාව සලකන්න

$A + B \longrightarrow C$ මෙහි A ට සාපේක්ෂව පළමුපෙල වේ. A ගේ සාන්ද්‍රණයට සාපේක්ෂව B ගේ සාන්ද්‍රණය ඉතා ඉහළ අගයක් ගනී. C ගේ සාන්ද්‍රණය කාලය සමග විද්‍යනය මින් කුමන ප්‍රස්ථාරයෙන් නිරූපණය වේද?

I.



II.



III.


IV.




V




29) $aA + bB \longrightarrow cC$ යන පොදු ප්‍රතික්‍රියාවේ A,B,හා C වලට සාපේක්ෂව ප්‍රායෝගිකව මනින ලද සීඝ්‍රතා උපයෝගී කර ගනිමින් A ට සාපේක්ෂව පෙළ නිර්ණය කරන ලදී. මෙහිදී ලැබුණ සීඝ්‍රතා නියත පිළිවෙලින් Ka, Kb, Kc විය. මෙම රාශි අතර නිවැරදි සම්බන්ධතාව

I. $a:b:c = k_a : k_b : k_c$

II. $a:b:c = k_c : k_b : k_a$

III. $\dfrac{k_a}{k_b} = \dfrac{a}{b} ; \dfrac{k_c}{k_a} = \dfrac{c}{a}$

IV. $a \times b \times c = k_a \times k_b \times k_c$

V. $a + b + c = k_a + k_b + k_c$

30) පහත ප්‍රතික්‍රියා අනුක්‍රමය සලකන්න




P හා Q පිලිවෙලින්

I.




II




III




IV




V



31 සිට 40 දක්වා පහත උපදෙස් පිළිපදින්න. එක් එක් ප්‍රශ්නයේ දී ඇති a,b,c සහ d යන ප්‍රතිචාර හතර අතුරින් එකක් හෝ වැඩි සංඛ්‍යාවක් නිවැරදිය.නිවැරදි ප්‍රතිචාරය කවරක්දැයි තෝරන්න.පිළිතුරු පත්‍රයේ පහත පරිදි ලකුණු කරන්න

| (1) | (2) | (3) | (4) | (5) |
|---|---|---|---|---|
| a හා b පමණක් නිවැරදියි | Bහා c පමණක් නිවැරදියි | c හා d පමණක් නිවැරදියි | d හා a පමණක් නිවැරදියි | වෙනත් ප්‍රතිචාර සංඛ්‍යාවක් හෝ සංයෝජනයක් නිවැරදි |

31) d ගොනුවේ මූලද්‍රව්‍ය සහ ඒවායේ සංයෝග පිළිබඳව පහත කුමන ප්‍රකාශ නිවැරදිද?

a. ආම්ලික මාධ්‍යයේදී $CrO_4^{2-}$ අයන $Cr_2O_7^{2-}$ අයන බවට පත්වේ

b. භාෂ්මික මාධ්‍යයේදී $MnO_4^-$ අයන $MnO_4^{2-}$ බවට පත්වේ

c. $[FeCl_4]^-$ කහ පැහැතිය

d. $[ZnCl_4]^{2-}$ අවර්ණය

32) පහත දැක්වෙන කුමන ප්‍රකාශය නිවැරදිවේද?




a. P,Q,R,S,පරමාණු එකම සරල රේඛාවේ පිහිටයි
b. P,Q,R,S,T පරමාණු එකම සරල රේඛාවේ පිහිටයි
c. RST කෝණය $104^0$ වේ
d. STU කෝණය $120^0$ ආසන්න වේ

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

33) ස්වයංසිද්ධ නැඹුරුතාවයකින් යුත් ප්‍රත්‍යාවර්ථ ප්‍රතික්‍රියාවක ගිබ්ස් යෝජ්‍ය ශක්ති විචලනය පහත සටහනේ දැක්වෙයි. ඒ සම්බන්ධ නිවැරදි ප්‍රකාශ වන්නේ




a. සමතුලිතතා ලක්ෂ්‍යය ප්‍රතික්‍රියක හෝ ප්‍රතිඵල වලට කෙතරම් සමීපදැයි අර්ථ දැක්වෙන්නේ $\Delta G_r^\theta$ මගිනි
b. X අවස්ථාවේදී ඵලවලට හිතකව සිදුවෙයි
c. Y අවස්ථාවේ දී ප්‍රතික්‍රියක වලට හිතකරව සිදු නොවෙයි
d. Z අවස්ථාවේ දී පද්ධතිය ගතික සමතුලිතතාවය පත්ව නැත.

34) $CH_3 - CH_2 - O\text{-}H$ සංයෝගය HBr සමග ප්‍රතික්‍රියාව සලකන්න
a. ප්‍රධාන අවසන් කාබනික ඵලය Bromoethane
b. මෙම ප්‍රතික්‍රියාව නියුක්ලියෝෆිලික ආදේශ වර්ගයේය
c. මෙම ප්‍රතික්‍රියාවඉලෙක්ට්‍රොෆිලික ආකලන වර්ගයේය
d. සුලු ඵලයක් ලෙස $CH_2= CH_2$ ඇති වෙයි

35) පහත දැක්වෙන්නේ $CO_2$ වල කලාප සටහනක දල සටහනයි.



2 atm වල නියතව පවතින $CO_2$ සාම්පලයක උෂ්ණත්වය $-80^0C$ සිට $-10^0C$ දක්වා උෂ්ණත්වය වැඩි කරයි.මෙම ක්‍රියාවලිය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ

a. ක්‍රියාවලියේදී $CO_2$ ඝන අවස්ථාවේම පවතියි
b. ක්‍රියාවලිය අතරතුර $CO_2$ ඝන අවස්ථාවෙන් වායු අවස්ථාවට පත්වේ
c. ක්‍රියාවලිය අතරතුර ද්‍රව $CO_2$ නිරීක්ෂණය නොවෙයි
d. ක්‍රියාවලිය අතරතුර $CO_2$ ඝන අවස්ථාවෙන් ද්‍රව අවස්ථාවට පත්වෙයි

36) පහත අණු හතර සලකන්න



(1) (2) (3) (4)

නිවැරදි ප්‍රකාශ වන්නේ

a. අණු හතරම ගෝලීය උණුසුමට සුළුවෙන් හෝ දායකවිය හැක
b. අණු හතරම ඕසෝන් හායනයට දායක වේ.
c. අණු සියල්ලම ශීතකාරක වායු ලෙස යොදාගත නොහැක.
d. ඕසෝන් හායනයට වැඩිම දායකත්වය පළමු(1) අණුව ලබාදෙයි

37) හැලජන සහ කැල්කොජන සම්බන්ධයෙන් කුමන ප්‍රකාශය නිවැරදි වෙයිද?

a. හැලජන කාණ්ඩයේ පහළට යනවිට බන්ධන විඝටන එන්තැල්පිය අඩුවෙයි
b. කාණ්ඩ දෙකෙහිම පහළට යනවිට ඔක්සිකාරගුණය වැඩිවෙයි
c. කාණ්ඩ දෙකෙහිම පහළට විද්‍යුත් සෘණතාවය අඩුවෙයි
d. O හා S බහුරූපිතාවය පෙන්වයි

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

38) කාමර උෂ්ණත්වයේ ක්‍රියාත්මක වන විට ලෙක්ලාන්ච් කෝෂය සම්බන්ධයෙන් කුමන ප්‍රකතාශය නිවැරදි වේද?

$$E^{\theta}_{cell} = 1.5V$$

$$Zn_{(s)} \rightleftharpoons Zn^{2+}_{(aq)} + 2e$$

a. $Zn_{(s)} \rightleftharpoons Zn^{2+}_{(aq)} + 2e$ යන සමතුලිතය දකුණට නැඹුරු වේ.

b. $2NH^{+}_{4(aq)} + 2e + MnO_{2(s)} \rightleftharpoons 2NH_{3(aq)} + Mn_2O_{3(aq)} + H_2O_{(l)}$ යන සමතුලිතය වමට නැඹුරු වේ.

c. ලවන සේතුවක් මගින් අයන තුල්‍යතාවය (විද්‍යුත් විච්ඡේද්‍යවල ) ඇතිවෙයි

d. කාලයත් සමග $E^{\theta}_{cell}$ අගය අඩුවෙයි

39) නියත උෂ්ණත්වයේ පරිපූර්ණ වායු සහ තාත්වික වායු පිලිබඳව පහත කුමන ප්‍රකාශය නිවැරදිද?

a. පරිපූර්ණ වායු සඳහා Z=1 වන අතර තාත්වික වායු සඳහා සැමවිටම Z>0 වෙයි.

b. වැඩි පීඩන තත්ව යටතේ තාත්වික වායු පරිපූර්ණ හැසිරීමට ආසන්න නොවේ.

c. වැන්ඩවාල් සමීකරණය තාත්වික වායු සඳහා පමණක් වලංගුවෙයි

d. තාත්වික වායු පහල පීඩනවලදී පරිපූර්ණ හැසිරීමට ලඟාවෙයි

40) කාර්මික ක්‍රියාවලි සම්බන්ධව පහත කුමන ප්‍රකාශ නිවැරදිවේද?

a. Mg නිස්සාරණය මූලික පියවර හතරකින් යුක්තය

b. කෝස්ටික් සෝඩා නිපදවීමට පොදුවේ ක්ලොරෝ ඇල්කලි කෝෂ භාවිත කරයි

c. සබන් නිෂ්පාදනය ප්‍රධාන පියවර පහකි.

d. කෘතිම ක්ෂාලකවල ප්‍රධාන සංරචකය ඇල්කනයිල් බෙන්සිල්සල්ෆොනේට් සංයෝගයයි.

අංක 41 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නය සඳහා ප්‍රකාශ දෙක බැගින් ඉදිරිපත් කර ඇත.එම ප්‍රකාශ යුගලයට හොඳින්ම ගැලපෙනුයේ පහත වගුවේ පරිදි (1),(2),(3),(4),(5) ප්‍රතිචාර වලින් කවර ප්‍රතිචාරය දැයි තෝරා ලකුණු කරන්න

| ප්‍රතිචාර | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පහදයි |
| 2 | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැන්න නිවැරදිව පැහැදිලි නොකරයි |
| 3 | සත්‍ය | අසත්‍ය |
| 4 | අසත්‍ය | සත්‍ය |
| 5 | අසත්‍ය | අසත්‍ය |

| පළමු වැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|
| 41) $Cr^{3+}$ ජලීය ද්‍රාවණයට ජලීය $NH_3$ ස්වල්පයක් දැමුවිට දම්පැහැ ද්‍රාවණය නිල්කොළ ජෙලටිනිමය අවක්ෂේපයක් බවට පත්වේ | සංකීර්ණය $Cr(OH)_3$ අවක්ෂේපය බවට පත්වෙයි. |
| 42) $CH_3COONH_4$ ජලීය ද්‍රාවණය ස්වාරක්ෂක ගුණ පෙන්වයි | සංයුග්මක අම්ලයක් සහ සංයුග්මක භශ්මයක් ජලීය තත්වයේ පවතින විට ස්වාරක්ෂක ගුණ පෙන්විය හැක |
| 43) හුමාල ආසවනය මගින් සගන්ධතෙල් නිස්සාරණය කරයි | හුමාල ආසවනය තුල ඩෝල්ටන්ගේ ආංශික පීඩන නියමය සිද්ධාන්තමය වශයෙන් යෙදේ |
| 44) අවධි උෂ්ණත්වයට ඉහළ උෂ්ණත්වයක ද්‍රව අවස්ථාව පැවතිය හැකිය | සම්පීඩනය මගින් වායුවක් ද්‍රව බවට පත්වන ඉහලම උෂ්ණත්වය අවධි උෂ්ණත්වයයි. |
| 45) පාර ත්‍රිමාන සමාවයවික නොවන ත්‍රිමාන සමාවයවික ප්‍රතිරූප අවයව සමාවයවික විය යුතුය. | ප්‍රතිරූප අවයව සමාවයවිකතතාවය පෙන්වීමට අසමමිතික කාබන් පරමාණුවක් $sp^3$ මුහුම්රණය වී තිබිය යුතුය. |
| 46) බෙන්සීන් වල ආරෝමැටික ස්ථායිතාවයක් ඇත. | ඉලෙක්ට්‍රෝන 4, 6, 8 සංඛ්‍යා සහිත වලාවන් ඇරෝමැටික ස්ථායිතාවය පෙන්වයි |

| | |
|---|---|
| 47) රේඛීය  පොලිතින් අණු වලින් ඉහළ ඝනත්ව පොලිතින් (HDPE) සෑදෙයි | රේඛීය අණු සහිත පොලිතින් ඉතා ළඟින් ක්‍රමානුකූලව ඇසිරීම සිදුවෙයි. |
| 48) ඩයැසෝයිනම් අයනය ෆීනෝල් සමග ප්‍රතික්‍රියාව ඉලෙක්ට්‍රොෆිලික ආදේශ ප්‍රතික්‍රියාවකි. | ඩයැසෝනියම් අයන ෆීනෝල් සමග ප්‍රතික්‍රියාවෙන් රතුපාට ඇසෝඩයි වර්ගයක් ලැබේ. |
| 49) බහු පියවර ප්‍රතික්‍රියාවක පලමු පියවරට පසුව එන පියවරක් සීඝ්‍රතා නිර්ණ පියවර වන විට කලින් ඇති පියවරයන් ප්‍රත්‍යවර්ථ වීම සාමානය සිද්ධියකි | සීඝ්‍රතා නිර්ණ ප්‍රතික්‍රියාවට සහභාගි වන ප්‍රතික්‍රියක හැරුන විට අනිකුත් සියලුම ප්‍රතික්‍රියක වලට සාපේක්ෂව පෙළ ශුන්‍ය විය යුතුය |
| 50) $HNO_3$ සහිත නැවක් මුහුදේදී අනතුරට ලක්වී $HNO_3$ වෙළාශ්‍රිත පරිසරයට නිකුත් වීම නිසා එම ජලජ පරිසරයේ pH අගය වැඩිවිය හැක | $HNO_3$ අම්ල වැසි වලට දායකවන ප්‍රභේදයකි |

සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved

සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ பரீட்சைத் திணைக்களம்
Department of Examination - Sabaragamuwa

අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
of Examination - Sabaragamuwa Department of Examination Department of Examination- Sabaragamuwa
අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
of Examination - Sabaragamuwa Department of Examination Department of Examination- Sabaragamuwa
සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය 2021
## General Certificate Of Education (Adv. Level) Examination.

රසායන විද්‍යාව II
**Chemistry II**

02 S II

පැය තුනයි
**Three hours**

- ආවර්තිතා වගුවක් 23 වැනි පිටුවේ සපයා ඇත.
- **ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.**
- සර්වත්‍ර වායු නියතය, $R = 8.314\ JK^{-1}\ mol^{-1}$
- ප්ලාන්ක් නියතය, $h = 6.626 \times 10^{-34}$ JS
- ඇවගාඩ්රෝ නියතය, $N_A = 6.022 \times 10^{23}\ mol^{-1}$
- ආලෝකයේ ප්‍රවේගය, $c = 3 \times 10^{8}\ ms^{-1}$
- **මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී ඇල්කයිල් කාණ්ඩ සංක්ෂිප්ත ආකාරයකින් නිරූපණය කළ හැකිය.**

උදාහරණ



කාණ්ඩය $CH_3CH_2$ - ලෙස දැක්විය හැකි ය.

➢ **A කොටස - ව්‍යුහගත රචනා**

❖ **සියලු ම** ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

❖ ඔබේ පිළිතුරු එක් එක් ප්‍රශ්නයට ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

➢ **B කොටස සහ C කොටස - රචනා**

❖ එක් එක් කොටසින් ප්‍රශ්න **දෙක** බැගින් තෝරා ගනිමින් ප්‍රශ්න **හතරකට** පිළිතුරු සපයන්න. මේ සඳහා සපයනු ලබන කඩදාසි භාවිතා කරන්න.

❖ සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු **A, B** සහ **C** කොටස් තුනට පිළිතුරු **A** කොටස මුලින් තිබෙන පරිදි එක් පිළිතුරු පත්‍රයක් වන සේ අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.

❖ ප්‍රශ්න පත්‍රයෙහි , **B** සහ **C** කොටස් **පමණක්** විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

❖ **පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| කොටස | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| A | 1 | |
| | 2 | |
| | 3 | |
| | 4 | |
| B | 5 | |
| | 6 | |
| | 7 | |
| C | 8 | |
| | 9 | |
| | 10 | |
| එකතුව | | |

එකතුව

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

(දෙවැනි පිටුව බලන්න.)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

## A කොටස - රචනා

ප්‍රශ්න හතරටම මෙම ප්‍රශ්ණ පත්‍රයේම පිළිතුරු සපයන්න.

(එක් එක් ප්‍රශ්නයට **ලකුණු 100** බැගින් ලැබේ.)

(01) (a) පහත දැක්වෙන ප්‍රශ්ණ වලට තිත් ඉරි මත පිළිතුරු සපයන්න.

(i) $O^{2-}$ , $S^{2-}$ සහ $F^{-}$ යන අයන තුන අතරින් **විශාලම** අයනික අරය ඇත්තේ කුමකටද? ------------------------

(ii) $Na_2O$ , $MgO$ සහ $MgS$ යන සංයෝග තුන අතුරෙන් **වැඩිම** සහසංයුජ ලක්ෂණ ඇති සංයෝගය කුමක්ද? ------------------------

(iii) Be , C සහ N යන මූල ද්‍රව්‍ය තුන අතුරෙන් ඉලෙක්ට්‍රෝන බන්ධුතාවය, ($X^-_{(g)} \longrightarrow X_{(g)} + e$ ; X = Be , C , N ) ධන අගයක් වන්නේ කුමකද? ------------------------

(iv) $H_2SO_4$ , $H_2SO_3$ සහ $H_2S_2O_3$ යන සංයෝග තුන අතුරින් **වඩාත්ම** විද්‍යුත් සෘණ සල්ෆර් පරමාණුව ඇත්තේ කුමකද? ------------------------

(v) $H_2S$ , $NaCl$ සහ $CO_2$ යන සංයෝග තුන වෙන වෙනම ජලයේ දිය කල විට ඇති වන ද්විතියික අන්තර් ක්‍රියාව **ප්‍රබලම** වන්නේ කුමන සංයෝගයේද? ------------------------

(vi) $NH_3$ සහ $NF_3$ යන සංයෝග දෙක අතරින් බන්ධන කෝණය **විශාලම** වන්නේ කුමන සංයෝගයේද? ------------------------

(b) (i) $CNO_2^-$ අයනය සඳහා වඩාත්ම පිළිගත හැකි ලුවිස් තිත් ඉරි ව්‍යුහය අදින්න. එහි සැකිල්ල පහත දක්වා ඇත.

O – C – N – O

(ii) මෙම අයනය සඳහා තවත් ලුවිස් තිත් - ඉරි ව්‍යුහ (සම්ප්‍රයුක්ත ව්‍යුහ) තුනක් අදින්න. ඔබ අදින ලද ව්‍යුහ ස්ථායිද අස්ථායිද යන්න එම ව්‍යුහ යටින් ලියා දක්වන්න.

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(iii) පහත සඳහන් ලුවිස් තිත් ඉරි - ව්‍යුහය සහ එහි ලේබල් කරන ලද සැකිල්ල පදනම් කරගෙන දී ඇති වගුව සම්පූර්ණ කරන්න.





| | $N^1$ | $C^2$ | $O^3$ | $C^4$ |
|---|---|---|---|---|
| පරමාණුව වටා VSEPR යුගල් | | | | |
| පරමාණුව වටා ඉලෙක්ට්‍රෝන යුගල් ජ්‍යාමිතිය | | | | |
| පරමාණුව වටා හැඩය | | | | |
| පරමාණුවේ මුහුම්කරණය | | | | |

- කොටස් (iv) සිට (vii) ඉහත (iii) කොටසෙහි දෙන ලද ලුවිස් තිත් - ඉරි ව්‍යුහය මත පදනම් වේ. පරමාණු ලේබල් කිරීම (iii) කොටසෙහි ආකාරයටම වේ.

(iv) පහත දැක්වෙන පරමාණු දෙක අතර σ බන්ධන සෑදීමට සහභාගී වන පරමාණුක / මුහුම් කාක්ෂික හඳුනාගන්න.

I. $H - N^1$ H .................... $N^1$ ....................

II. $N^1 - F$ $N^1$ .................... F ....................

III. $N^1 - C^2$ $N^1$ .................... $C^2$ ....................

IV. $C^2 - O^3$ $C^2$ .................... $O^3$ ....................

V. $O^3 - C^4$ $O^3$ .................... $C^4$ ....................

VI. $C^4 - N$ $C^4$ .................... N ....................

(v) පහත දැක්වෙන පරමාණු දෙක අතර π බන්ධන සෑදීමට සහභාගී වන පරමාණුක කාක්ෂික හඳුනාගන්න.

I. $C^2 - O$ $C^2$ .................... O ....................

II. $C^4 - N$ $C^4$ .................... N ....................

$C^4$ .................... N ....................

(vi) $N^1$ , $C^2$ , $O^3$ සහ $C^4$ පරමාණු වටා ආසන්න බන්ධන කෝණ සඳහන් කරන්න.

$N^1$ .............. $C^2$ .............. $O^3$ .............. $C^4$ ..............

(හතරවැනි පිටුව බලන්න.)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(vii) $N^1$ , $C^2$ , $O^3$ සහ $C^4$ පරමාණු වල විද්‍යුත් සෘණතාව වැඩිවන පිළිවෙලට සකසන්න.

------------------ < ------------------ < ------------------ < ------------------

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(c) H සහ Cl පරමාණු සංයෝජනය වී σ බන්ධනයක් සහිත විෂම ජාතීය ද්වී පරමාණුක HCl අණුව සාදයි. මෙය H – Cl ලෙස නිරූපනය කරයි.

(i) H හා Cl අතර σ බන්ධන වර්ගය හඳුනා ගැනීමට යොදා ගන්නා නම කුමක්ද?

---------------------------------------------------------------------------------------

(ii) HCl අණුවේ භාගික ආරෝපන ($\delta^+$ සහ $\delta^-$) ස්ථානගත වී ඇත්තේ කෙසේදැයි පෙන්නුම් කරන්න.

---------------------------------------------------------------------------------------

(iii) HCl අණුවේ ද්විධ්‍රැව සූර්ණය ($\mu$) ගණනය කිරීමට භාවිතා කරන සමීකරණය ලියන්න.

---------------------------------------------------------------------------------------

(iv) HCl අණුවේ ද්විධ්‍රැව සූර්ණය යොමුවන දිශාව පෙන්නුම් කරන්න.

---------------------------------------------------------------------------------------

(v) පහත දැක්වෙන දත්ත උපයෝගී කරගනිමින් HCl අණුවේ H – Cl බන්ධනයේ අයනික ස්වභාවයේ ප්‍රතිශතය ගණනය කරන්න.

HCl අණුවේ,

$$\left.\begin{array}{l}\text{H – Cl බන්ධනයේ අයනික} \\ \text{ස්වභාවයේ ප්‍රතිශතය}\end{array}\right\} = \frac{\text{HCl වල ද්විධ්‍රැව සූර්ණය}}{\text{HCl අණුවේ ද්විධ්‍රැව සූර්ණය}} \text{ වේ.}$$

HCl වල ද්විධ්‍රැව සූර්ණය = $3.44 \times 10^{-30}$ Cm

ධ්‍රැවයක ආරෝපණය = $1.6 \times 10^{-19}$ C

HCl බන්ධන දිග = $127.5 \times 10^{-12}$ m

100

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(02) (a) A , B , C , D සහ E යනු P ගොනුවට අයත් මූලද්‍රව්‍යය වල උපරිම ඔක්සිකරණ අවස්ථාවට අදාල ඔක්සයිඩ වේ. මෙම මූලද්‍රව්‍යය වල පරමාණුක ක්‍රමාංක 20 ට අඩුවන අතර ඒවා එකම ආවර්තයක ඇත. ඒවායේ බන්ධන ආකාරය සහ ජලය සමග ප්‍රතික්‍රියා කල විට ලබා දෙන ඵල වල විස්තර පහත දී ඇත.

| සංයෝගය | බන්ධන ආකාරය | ජලය සමග ලබා දෙන ඵල |
|---|---|---|
| A | සහ සංයුජ ද්වි අණුක | ත්‍රි භාෂ්මික දුබල අම්ලයක් ($P_1$) |
| B | උභය ගුණී | ප්‍රතික්‍රියාවක් නැත. |
| C | සහ සංයුජ | ද්විභාෂ්මික ප්‍රබල අම්ලයක් ($P_2$) |
| D | ජාල සහ සංයුජ | ප්‍රතික්‍රියාවක් නැත. |
| E | සහ සංයුජ | ඒක භාෂ්මික ප්‍රබල අම්ලයක් ($P_3$) |

(i) A , B , C , D සහ E හඳුනාගන්න. (රසායනික සූත්‍ර දෙන්න)

A : ----------- B : ----------- C : ----------- D : ----------- E : -----------

(ii) $P_1$ , $P_2$ සහ $P_3$ ඵල ලබා දෙමින් ජලය සමග A , C සහ E දක්වන ප්‍රතික්‍රියා වලට තුලිත රසායනික සමීකරණ දෙන්න.

A : ------------------------------------------------------------------------------------------

C : ------------------------------------------------------------------------------------------

E : ------------------------------------------------------------------------------------------

(iii) A , B , C , D සහ E යන සංයෝග NaOH සමග සිදුකරන ප්‍රතික්‍රියා සඳහා තුලිත රසායනික සමීකරණය ලියන්න.

A : ------------------------------------------------------------------------------------------

B : ------------------------------------------------------------------------------------------

C : ------------------------------------------------------------------------------------------

D : ------------------------------------------------------------------------------------------

E : ------------------------------------------------------------------------------------------

(හයවැනි පිටුව බලන්න.)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(b) $H_2O_2$ , $Na_2S_2O_3$ , KI , $BaCl_2$ , $AgNO_3$ සහ $H_2SO_4$ වල ජලීය ද්‍රාවණ අඩංගු P, Q, R, S, T, U (පිලිවෙලින් නොවේ) ලෙස ලේබල් කර ඇති බෝතල් ශිෂ්‍යයෙකුට ලබා දෙන ලදී. ඒවා හඳුනා ගැනීම සඳහා වරකට ද්‍රාවණ දෙක බැගින් මිශ්‍ර කිරීමෙන් ලැබුණු සමහර ප්‍රයෝජනවත් නිරීක්ෂණ පහත දක්වා ඇත.

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

| | මිශ්‍රකල ද්‍රාවණ | නිරීක්ෂණ |
|---|---|---|
| I | P + S | වර්ණවත් ද්‍රාවණයක් |
| II | U + S | කහ අවක්ශේපයක් |
| III | U + Q | සුදු අවක්ශේපයක් ලැබී ටික වේලාවකදී එය කළු පැහැයට හැරේ |
| IV | T + Q | අපහැදිලි ද්‍රාවණයක් |
| V | R + T | සුදු අවක්ශේපයක් |
| VI | R + U | සුදු අවක්ශේපයක් |

(i) P සිට U හඳුනාගන්න.

P : -------------------------- Q : -------------------------- R : --------------------------

S : -------------------------- T : -------------------------- U : --------------------------

(ii) ඉහත I සිට VI දක්වා ඇති එක් එක් ප්‍රතික්‍රියාව සඳහා තුලිත රසායනික සමීකරණ දෙන්න.

I : ----------------------------------------------------------------

II : ----------------------------------------------------------------

III : සුදු අවක්ශේපය සෑදීම : ------------------------------------------

කළු පැහැයට හැරීම : ------------------------------------------

IV : ----------------------------------------------------------------

V : ----------------------------------------------------------------

VI : ----------------------------------------------------------------

100

(හත්වැනි පිටුව බලන්න.)

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(03) (a) දෙන ලද උෂ්ණත්වයකදී සිදුවන පහත ප්‍රතික්‍රියාව සලකන්න.

$$2\ H_2O_{2\ (l)} \longrightarrow 2\ H_2O_{\ (l)} + O_{2\ (g)}$$

(i) $O_{2\ (g)}$ සෑදීමේ සීඝ්‍රතාව සඳහා ප්‍රකාශනය ලියන්න.

(ii) $H_2O_2$ වියෝජනය වීමට සලස්වා පිටවන $O_2$ වායුව එකතු කරගන්නා ලදී. තත්පර 400 ක කාලයක් තුල පිටවූ $O_2$ වායුවේ ආංශික පීඩනය $9.98 \times 10^{1}$ Pa වූ අතර වායුව 300 K ක උෂ්ණත්වයේ පැවතිනි. මෙම කාල පරාසයේදී $O_2$ සෑදීමේ සාමාන්‍ය සීඝ්‍රතාව ගණනය කරන්න.

(iii) $H_2O_{2\ (l)}$ වැයවන සාමාන්‍ය සීඝ්‍රතාව සහ $H_2O_{\ (l)}$ සෑදෙන සාමාන්‍ය සීඝ්‍රතාව ගණනය කරන්න.

(අටවැනි පිටුව බලන්න.)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(iv) 300 K දි කාලය සමග $H_2O_{2\,(l)}$ හි සාන්ද්‍රණ වෙනස් වීම පහත පරිදි වේ.




$H_2O_{2\,(l)}$ ට සාපේක්ෂව පෙළ අපෝහනය කරන්න.

(v) ප්‍රතික්‍රියාවේ වේග ප්‍රකාශනය ලියන්න.

(vi) log (සීඝ්‍රතාව) සහ log $[H_2O_2]$ අතර ප්‍රස්ථාරය අඳින්න.

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(vii) $t_{\frac{1}{2}} = \frac{0.693}{K}$ ලෙස දී ඇත්නම් ප්‍රතික්‍රියාවේ සීඝ්‍රතා නියතය K ගණනය කරන්න.

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(viii) ප්‍රතික්‍රියාවේ 99.6 % ක් සම්පූර්ණ වීමට ගතවන කාලය සොයන්න.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(b) ඉහත (a) හි විස්තර කල ප්‍රතික්‍රියාව වන $2\ H_2O_{2\,(l)} \longrightarrow 2\ H_2O_{(l)} + O_{2\,(g)}$ සඳහා 298 K දී $H_2O_{2(l)}$ , $H_2O_{(l)}$ සහ $O_{2(g)}$ හි ගිබ්ස් ශක්තීන් (G) පිළිවෙලින් – 120.4 $KJmol^{-1}$ , – 237.1 $KJmol^{-1}$ සහ 0.00 $KJmol^{-1}$ වේ.

(i) 298 K දී ප්‍රතික්‍රියාවේ ΔG ($KJmol^{-1}$ වලින්) ගණනය කරන්න.

(ii) ඉහත ප්‍රතික්‍රියාවේ 298 K දී ΔS හි විශාලත්වය 125.7 $JK^{-1}mol^{-1}$ වේ. ΔS සඳහා නිවැරදි ලකුණු (+ හෝ - ) භාවිතා කරමින් 298 K දී ප්‍රතික්‍රියාව සඳහා ΔH ගණනය කරන්න.

(iii) ඉහත (ii) හි ලබාගත් ΔH හි ලකුණු (+ හෝ - ) අනුව මෙම ප්‍රතික්‍රියාව තාප දායකද තාප අවශෝෂකද යන වග පැහැදිලි කරන්න.

100

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(04) (a) A , B හා C යනු අණුක සූත්‍රය $C_7H_{12}$ වන ව්‍යුහ සමාවයවික වේ. මේවා සියල්ලම ප්‍රකාශ සමාවයවිකතාවය පෙන්වයි. A , B හා C සංයෝග තුනම උත්ප්‍රේරිත හයිඩ්‍රජනීකරණය ( Ni / $H_2$ සමග ) කල විට එකම D ($C_7H_{16}$) සංයෝගය ලබා දෙයි. D සංයෝගයද ප්‍රකාශ සමාවයවිකතාවය දක්වයි.
A , B හා C යන සමාවයවික තුනම $HgSO_4$ / තනුක $H_2SO_4$ සමග පිරියම් කල විට ලබා දෙන ඵල 2, 4 – ඩයිනයිට්‍රො ෆෙනිල්හයිඩ්‍රසීන් ( 2, 4 – DNP ) සමග ප්‍රතික්‍රියා කර වර්ණවත් අවක්ශේප දෙයි. B හා C පමණක් ඇමෝනීකෘත $AgNO_3$ සමග අවක්ශේප ලබා දෙයි. A , $HgSO_4$ / තනුක $H_2SO_4$ සමග ප්‍රතික්‍රියා කර E හා F යන ඵල දෙක ලබා දෙයි. B $HgSO_4$ / තනුක $H_2SO_4$ සමග ප්‍රතික්‍රියා කර එක් ඵලයක් පමණක් ලබා දෙන අතර එය F වේ.

(i) A , B , C , D , E හා F වල ව්‍යුහයන් පහත දී ඇති කොටු තුල අදින්න.

A

B

C

D

E

F

(ii) A , B හා C යන සංයොග වෙන වෙනම $H_2$ / Pd / $BaSO_4$ / ක්විනෝලින් සමග ප්‍රතික්‍රියා කල විට කුමන සංයෝගය පාර ත්‍රිමාන සමාවයවිකතාව පෙන්වන ඵලයක් ලබා දෙන්නේද.

(දොලොස්වැනි පිටුව බලන්න.)

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

(iii) C වැඩිපුර HBr සමග ප්‍රතික්‍රියා කර ලබා දෙන G එලයේ ව්‍යුහය කොටුව තුල අදින්න.

(iv) F පහත දී ඇති ප්‍රතික්‍රියා වලදී ලබා දෙන X හා Y වල ව්‍යුහ අදාල කොටු තුල අදින්න.




(v) X හා Y එකිනෙකින් වෙන් කර හඳුනා ගැනීමට පරීක්ෂාවක් නම් කරන්න.

(b) (i) පහත දී ඇති කොටු තුල K , L සංයෝග වල ව්‍යුහ ඇදීමෙන් සහ P , Q , R සහ S ප්‍රතිකාරක / උත්ප්‍රේරක දෙමින් පහත දී ඇති ප්‍රතික්‍රියා අනුක්‍රම තුන සම්පූර්ණ කරන්න.

අනුක්‍රමය I

$$CH_3-CH=CH_2 \xrightarrow[\text{ප්‍රතික්‍රියාව I}]{P} CH_3-\underset{}{\overset{Br}{|}}{CH}-CH_3 \xrightarrow[\text{ප්‍රතික්‍රියාව II}]{CH_3CH_2O^-Na^+} K$$

P

K

(දහතුන්වැනි පිටුව බලන්න.)

මෙම තීරයේ කිසිවක් නො ලියන්න

අනුක්‍රමය III




Q

L

R

අනුක්‍රමය III




S

(ii) ප්‍රතික්‍රියා I – VI අතුරෙන් තෝරා ගනිමින් පහත දක්වා ඇති එක් එක් ප්‍රතික්‍රියා වර්ගය සඳහා එක් නිදසුනක් බැගින් දෙන්න.

ඉලෙක්ට්‍රොෆිලික ආදේශ ------------------------------------------------

නියුක්ලියෝෆිලික ආකලන ------------------------------------------------

100

(දහහතරවැනි පිටුව බලන්න.)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved

සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ பரீட்சைத் திணைக்களம்
Department of Examination - Sabaragamuwa

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය **2021**
General Certificate Of Education (Adv. Level) Examination

රසායන විද්‍යාව II
**Chemistry II**

02 S II

❖ සර්වත්‍ර වායු නියතය R = 8.314 JK-1mol$^{-1}$
❖ ඇවගාඩ්‍රෝ නියතය $N_A$ = 6.022 x 1023 mol$^{-1}$

**B කොටස - රචනා**

ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න. ( එක් එක් ප්‍රශ්නයට **ලකුණු 150** බැගින් ලැබේ. )

(05) (a) $QR_{5\,(g)}$ සංයෝගය 500K ට වඩා ඉහල උෂ්ණත්ව වලදී පහත පරිදි වියෝජනය වේ.

$$QR_{5\,(g)} \rightleftharpoons QR_{3\,(g)} + R_{2\,(g)}$$

300 K දී $QR_{5\,(g)}$ 0.5 mol ක් 5 x $10^5$ Pa ක පීඩනයක් යටතේ සංවෘත දෘඩ භාජනයක් තුල පවතී. මෙම භාජනයේ උෂ්ණත්වය 601 K දක්වා රත් කල විට ඉහත සමීකරණය අනුව වියෝජනය වී සමතුලිතතාවයට පත්වේ. සමතුලිත පද්ධතියේ මුළු පීඩනය 14.03 x $10^5$ Pa වූ අතර 601 K දී RT හි ආසන්න අගය 5000 Jmol$^{-1}$ ලෙස යොදා ගන්න.

(i) සමතුලිත මිශ්‍රණය තුල ඇති $QR_{3\,(g)}$ , $QR_{5\,(g)}$ සහ $R_{2\,(g)}$ මවුල සංඛ්‍යාව ගණනය කරන්න.

(ii) 601 K දී ඉහත ප්‍රතික්‍රියාව සඳහා සමතුලිතතා නියතය Kp ගණනය කරන්න.

(iii) 601 K දී සමතුලිතතාවය සඳහා Kc ගණනය කරන්න.

(iv) ඉහත ගණනය කිරීම් වලදී යොදාගත් උපකල්පනය කුමක්ද?

(b) A හා B යනු වාෂ්පශීලී සහ සම්පුර්ණයෙන් මිශ්‍රවන ද්‍රව දෙකක් වන අතර ඒවා මිශ්‍ර කල විට පරිපුර්ණ ද්‍රාවණයක් සෑදෙයි. A ද්‍රවයෙන් 2 mol හා B ද්‍රවයෙන් 2 mol ක් අඩංගු මිශ්‍රණයක් සංවෘත බඳුනක තබන ලදී. මෙම පද්ධතිය සමතුලිතතාවයට එළඹි විට වායු කලාපයේ පීඩනය 2 x $10^4$ Pa ද පරිමාව 0.16628 m$^3$ ද වායු කලාපයේ $A/_B$ මවුල අනුපාතය ¼ බව ද සොයා ගන්නා ලදී. පද්ධතිය 400 K පවතීනම් පහත දෑ ගණනය කරන්න.

(i) වායු කලාපයේ ඇති මුළු මවුල ප්‍රමාණය සොයන්න.

(ii) වායු කලාපයේ ඇති A හා B මවුල ගණන සොයන්න.

(පහලොස්වැනි පිටුව බලන්න.)

(iii) ද්‍රව කලාපයේ A හා B මවුල භාග සොයන්න.

(iv) A හා B වල සංතෘප්ත වාෂ්ප පීඩනය සොයන්න.

(v) A හා B පරිපූර්ණ ද්‍රාවණයේ සංයුතිය සමග තාපාංක විචලනයේ කලාප රූප සටහනක් ඇඳ නම් කරන්න.

(06) (a) 298 K දී B නම් ඒක ආම්ලික දුබල හෂ්මයෙහි ජලය හා ඊතර අතර ව්‍යාප්ති සංගුණකය සෙවීම සඳහා පහත පරීක්ෂණය සිදු කරන ලදී.

I. සාන්ද්‍රණය 1 $moldm^{-3}$ වූ B ජලීය ද්‍රාවණයකින් 100 $cm^3$ ක් ගෙන ඊතර 100 $cm^3$ ක් දමා හොඳින් සොලවා නිශ්චලව තබන ලදී. 298 K දී දුබල හෂ්මයේ විඝටන නියතය $Kb = 1.8 \times 10^{-5}$ $moldm^{-3}$ වේ.

II. ඉහත සමතුලිත පද්ධතියේ ජලීය ස්ථරයෙන් 50 $cm^3$ ගෙන 1.6 $moldm^{-3}$ HCl ද්‍රාවණයක් සමග අනුමාපනය කරන ලදී. අනුමාපනයේ අන්ත ලක්ෂයේදී වැය වූ HCl පරිමාව 25 $cm^3$ ක් විය.

(i) සමතුලිතතාවයට පත් වූ පසු ජලීය ස්ථරයේ B හි සාන්ද්‍රණය ගණනය කරන්න.

(ii) ජලීය ද්‍රාවණයේ B හි විඝටනය නොසැලකිය හැකි බව සලකා ජලය සහ ඊතර අතර B හි ව්‍යාප්ති සංගුණකය ගණනය කරන්න.

(iii) සමතුලිතතාවයට පත් වූ පසු ජලීය ස්ථරයේ $P^H$ අගය ගණනය කරන්න.

(iv) අනුමාපනයේ සමකතා ලක්ෂයේ $P^H$ අගය ගණනය කරන්න.

(v) අනුමාපනයේ අර්ධ සමකතා ලක්ෂයේ $P^H$ අගය ගණනය කරන්න.

(vi) ඉහත (v) හි ද්‍රාවණය ස්වාරක්ෂක වේද නොවේද.

(vii) මෙම අනුමාපනය සඳහා මෙතිල් ඔරේන්ජ් ($P^{KIn} = 3.7$) සහ පිනෝප්තලීන් ($P^{KIn} = 9.6$) යන දර්ශකය සපයා ඇත. අනුමාපනයට සුදුසු දර්ශකය නම් කරන්න.

(b) $XA_{(s)}$ සහ $YA_{(s)}$ යනු ජලයේ ඉතා අල්ප ලෙස දියවන ලවණ දෙකකි.

(i) 25 $^0C$ දී $XA_{(s)}$ ලවණයෙහි ද්‍රාව්‍යතාවය 0.133 $mgdm^{-3}$ වේ. 25 $^0C$ දී $XA_{(s)}$ හි ද්‍රාව්‍යතා ගුණිතය ගණනය කරන්න. ( XA හි මවුලික ස්කන්ධය 188 $gmol^{-1}$ වේ.)

(ii) $X^+_{(aq)}$ මවුල 0.1 ක් හා $Y^+_{(aq)}$ මවුල 0.1 ක් අඩංගු වන 1.00 $dm^3$ ජලීය ද්‍රාවණයකට ජලයේ සම්පූර්ණයෙන් දියවන NaA ඝන ලවණය සෙමින් එකතු කරන ලදී.

I. පළමුව අවක්ෂේප වන්නේ මින් කුමන ලවණයද යන වග පුරෝකථනය කරන්න. ( $Ksp (YA) = 8.5 \times 10^{-17} mol^2dm^{-6}$ )

II. දෙවන ලවණය අවක්ෂේප වීම ආරම්භ වන විට ද්‍රාවණයේ ඉතිරිව ඇති පළමුව අවක්ෂේප වූ කැටායන සාන්ද්‍රණය ගණනය කරන්න.

III. දෙවන ලවණය අවක්ෂේප වන විට පළමුව අවක්ෂේප වූ කැටායනයේ අවක්ෂේප වී ඉවත් වූ ප්‍රතිශතය කොපමණද.

(දාසයවැනි පිටුව බලන්න.)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(07) (a) පහත සඳහන් ගැල්වානි කෝෂය හෙවත් වෝල්ටීයතා කෝෂය සලකන්න.




$E^0_{MnO_4^-(aq)/MnO_{2(s)}/OH^-(aq)}$ = + 0.60 V

$E^0_{Zn^{2+}(aq)/Zn(S)}$ = -0.76 V

Mn = 55 $gmol^{-1}$ , O = 16 $gmol^{-1}$

1 F = 96500 C

පහත ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.

(i) ඇනෝඩය හා කැතෝඩය මත සිදුවන අර්ධ ප්‍රතික්‍රියා ලියා දක්වන්න.

(ii) සම්පූර්ණ කෝෂ ප්‍රතික්‍රියාව ලියන්න.

(iii) 300 K දී කෝෂයේ විභවය $E^0_{cell}$ ගණනය කරන්න. විභවයේ සලකුණ අනුව එම ප්‍රතික්‍රියාව ස්වයංසිද්ධ වේද.

(iv) මෙම කෝෂයේ ධාරාව ගමන් කරන්නේ කුමන දිශාවටද.

(v) 300 K දී කෝෂය තුලින් 965 A ක ධාරාවක් තත්පර 900 ක කාලයක් තුල ගමන් කලේ නම්,

I. කෝෂය හරහා ගමන් කරන විද්‍යුත් ප්‍රමාණය කොපමණද.

II. සෑදෙන $MnO_2$ ස්කන්ධය කොපමණද.

(b) $M(NO_3)_n$ ලවනය ආසුැති ජලයේ ද්‍රවණය කල විට P නම් වර්ණවත් සංකීර්ණ අයනය සෑදේ. M , 3d ගොනුවට අයත් ආන්තරික මූල ද්‍රව්‍යයකි. P පහත දැක්වෙන ප්‍රතික්‍රියා වලට භාජනය වේ.




P , R හා S සංකීර්ණ අයන වේ.

(i) M ලෝහය හඳුනාගන්න.

(ii) P සංකීර්ණ අයනයේ M වල ඔක්සිකරන අවස්ථාව දෙන්න.

(iii) $M(NO_3)_n$ වල n හි අගය දෙන්න.

(iv) P සංකීර්ණ අයනයේ M වල සම්පූර්ණ ඉලෙක්ට්‍රෝනික වින්‍යාසය ලියන්න.

(v) P , Q , R , S හා T වල රසායනික සූත්‍ර ලියන්න.

(vi) P හා R හි IUPAC නම් ලියන්න.

(vii) P වල වර්ණය කුමක්ද.

(ix) P අඩංගු ජලීය ද්‍රාවණයට $K_4[Fe(CN)_6]$ දැමූ විට ලැබෙන වර්ණය කුමක්ද.

(ix) පහත I හා II හිදී ඔබ බලාපොරොත්තු වන නිරීක්ෂණ මොනවාද.

I. කාමර උෂ්ණත්වයේදී P අඩංගු ද්‍රාවණයට $SO_{2\,(g)}$ යැවූ විට,

II. I න් ලැබෙන මිශ්‍රණයට $BaCl_{2\,(aq)}$ එක්කර පසුව එයට තනුක $HNO_3$ එක් කල විට,



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

## C කොටස - රචනා

ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න. ( එක් එක් ප්‍රශ්නයට ලකුණු **150** බැගින් ලැබේ. )

(08) (a) (i) එකම කාබනික ආරම්භක සංයෝගය ලෙස $CH_3-CH(OH)-CH_3$ භාවිතා කරමින් G සංයෝගය සංස්ලේෂණය කිරීම සඳහා ප්‍රතික්‍රියා අනුක්‍රමයක් පහත දී ඇත.

A , B , C , D , E හා F සංයෝග වල ව්‍යුහ ඇඳීමෙන් සහ පියවර 1 – 6 සඳහා සුදුසු ප්‍රතිකාරක ලැයිස්තුවේ දී ඇති ඒවායින් පමණක් තෝරාගෙන ලිවීමෙන් මෙම ප්‍රතික්‍රියා අනුක්‍රමය සම්පූර්ණ කරන්න.




| ප්‍රතිකාරක ලැයිස්තුව |
|---|
| $PBr_3$ , $NaBH_4$ , NaOH , Mg / වියළි ඊතර , තනුක $H_2SO_4$ |

(ii) පහත දැක්වෙන ප්‍රතික්‍රියා දාමය සලකන්න.
G , H සහ K සංයෝග වල ව්‍යුහ අඳින්න. X , Y සහ Z ප්‍රතිකාරක ලබා දෙන්න.



(b) (i) පහත දැක්වෙන පරිවර්තනය තුනකට නොවැඩි පියවර සංඛ්‍යාවකින් සිදුකරන්නේ කෙසේදැයි පෙන්වන්න.




(ii) පහත ප්‍රතික්‍රියාව සලකන්න.




මෙම ප්‍රතික්‍රියාවේ ඵල වන P හා Q හඳුනාගන්න. මෙම ප්‍රතික්‍රියාවේ යාන්ත්‍රණය ලියන්න.

(c) එතිල් ඇමයින් එතනෝල් වලට වඩා භාෂ්මික වේ. මේවා $H_3O^+$ අයන සමග ප්‍රතික්‍රියාව සලකමින් ඉහත කරුණ පැහැදිලි කරන්න.

(09) (a) (i) පහත දැක්වෙන ගැලීම් සටහනේ දී ඇති A – Q දක්වා ඇති ද්‍රව්‍ය වල රසායනික සූත්‍ර ලියන්න.

( **සැ.යු** A – Q දක්වා ද්‍රව්‍ය හඳුනා ගැනීම සඳහා රසායනික සමීකරණ සහ හේතු බලාපොරොත්තු නොවේ.)

කඩ ඉරි කොටුව තුල දැක්වෙන සංකේත වලින් අවක්ශේප , ද්‍රාවණ සහ වායු නිරූපනය වේ.

(විසිවැනි පිටුව බලන්න.)

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub


අවක්ෂේප
ද්‍රාවණ
වායු
A
$NaOH_{(aq)}$
B
+
C
රෝස පාට
සුදු ක්‍රීම්පැහැති
අවර්ණ
$AgNO_3$
D
තනුක $NH_4OH$
පැහැදිලි අවර්ණ
සුදු පාට
E
අවර්ණ ගන්ධයක් රහිත ප්‍රතික්‍රියාශීලි ද්විපරමාණුක
F
HCl
A
+
G
කළු දුඹුරු
අවර්ණ
ලා කොළ
$H_2SO_4$ +
H
අවර්ණ
$H_2O$
$NH_4OH$ / $H_2s$
K
I
+
J
+
$K_2SO_4$
රතු
අවර්ණ
රතු දුඹුරු
N
අවර්ණ / ලා කහ
$CH_3COONa$
+
P
$(CH_3COO)_2Pb$
L
සුදු
අවර්ණ
M
O
අවර්ණ
අවර්ණ
රත් කිරීම
Q
+
ප්‍රභල ද්විභාෂ්මික අම්ලයක
කළු
දම් පාට ගෝලිකාවක්

(i) A හි ඇති කැටායනයේ ඉලෙක්ට්‍රෝනික වින්‍යාසය ලියන්න.

(ii) B $\longrightarrow$ F බවට පරිවර්තනය කිරීමට අදාල තුලිත රසායනික සමීකරණය ලියන්න.

(b) $KClO_3$ , KCl හා $KNO_3$ අඩංගු මිශ්‍රණයක යම් ස්කන්ධයක් ජලයේ දියකර 250 $cm^3$ ක් සාදන ලදී.

I. ඉහත ද්‍රාවණයෙන් 25 $cm^3$ ක් වැඩිපුර $SO_2$ සමග ප්‍රතික්‍රියා කරවා ක්ලෝරේට් අයන ක්ලෝරයිඩ බවට පත් කරන ලදී. ඉතිරි $SO_2$ රත් කර පද්ධතියෙන් ඉවත් කරන ලදී. එයට ආම්ලික $AgNO_3$ ද්‍රාවණයක් එක් කර සියලුම $Cl^-$ , AgCl ලෙස අවක්ෂේප කරන ලදී. අවක්ෂේප වූ AgCl ස්කන්ධය 0.1148 g විය.

II. මුල් ද්‍රාවණයෙන් 25 $cm^3$ ගෙන 0.2 $moldm^{-3}$ $FeSO_4$ 30 $cm^3$ ක් සමග රත් කරන ලදී. ප්‍රතික්‍රියා නොකල $FeSO_4$ සමග සම්පූර්ණයෙන් ප්‍රතික්‍රියා කිරීමට 0.08 $moldm^{-3}$ සාන්ද්‍රණයක් ඇති ඔක්සිකාරකයකින් 37.5 $cm^3$ ක් අවශ්‍ය විය. ෆෙරස් අයන ඔක්සිකාරකය සමග 1:1 මවුල අනුපාතයෙන් ප්‍රතික්‍රියා කරයි.

III. මුල් ද්‍රාවණයෙන් 25 $cm^3$ ක් ගෙන එයට Al කුඩු හා NaOH දමා රත් කරන ලදී. එවිට පිටවන වායුව 0.012 $moldm^{-3}$ $H_2SO_4$ ද්‍රාවණ 25 $cm^3$ ක් තුලට යවන ලදී. එම $H_2SO_4$ ද්‍රාවණය 0.016 $moldm^{-3}$ NaOH සමග අනුමාපනය කරන ලදී. එවිට වැයවූ NaOH පරිමාව 25 $cm^3$ ක් විය.

(i) ඉහත ක්‍රියා පිලිවෙල වලදී සිදුවන ප්‍රතික්‍රියා සඳහා තුලිත අයනික / රසායනික සමීකරණ ලියන්න.

(ii) ඉහත මිශ්‍රණයේ ඇති $KNO_3$ , $KClO_3$ සහ KCl මවුල සංඛ්‍යා ගණනය කරන්න.
(Ag – 108 , Cl – 35.5)

(විසිදෙවැනි පිටුව බලන්න.)

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(10) (a) පහත සඳහන් ප්‍රශ්ණ යකඩ නිෂ්පාදන ක්‍රියාවලිය හා සම්බන්ධ වේ.

(i) මෙම ක්‍රියාවලියේදී භාවිතා කරන එක් අමුද්‍රව්‍යයක් කෝක් (C) වේ. ඉතිරි අමුද්‍රව්‍යය නම් කරන්න.

(ii) යකඩ නිස්සාරනය සඳහා යොදා ගන්නා උපකරණ නම් කරන්න.

(iii) ඉහත නිෂ්පාදන ක්‍රියාවලියේදී කෝක් (C) හි කාර්යයන් තුලිත රසායනික සමීකරණ භාවිතා කරමින් දක්වන්න.

(iv) මෙම ක්‍රියාවලියේදී කෝක් ප්‍රධාන ඔක්සිහාරකය ලෙස ක්‍රියා කරන්නේ කුමන සංයෝගයද.

(v) 1000 $^0$C ට ඉහළ උෂ්ණත්වයේදී $CO_2$ (g) ට වඩා CO (g) වායුව තාප ගතිකව ස්ථායී වේ. පහත සමීකරණ උපයෝගී කර ගනිමින් ඉහත කරුණ පැහැදිලි කරන්න.

$O_2 (g) + C (s) \longrightarrow CO_2 (g)$ + තාපය (-393 KJ) ——— (1)

$O_2 (g) + 2 C (s) \longrightarrow 2 CO (g)$ + තාපය (-221 KJ) ——— (2)

